19

මගේ අංකය
எனது இல.
My No.
} HRC/AD/07/218

දිනය
திகதி
Date.
} 2020.08.31

ඔබේ අංකය
உமது இல.
Your No.
}

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා
ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයන් ඉවත් කිරීම සඳහා ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් අභිනවයෙන් පත්වූ ඔබතුමා හට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙනුවෙන් සුභාසිංශන පිරිනමනු කැමැත්තෙමු.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරණ පනත මගින් ස්ථාපිත කරනු ලැබ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය යටතේ ගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන ස්වාධීන කොමිෂන් සභාවක් වේ. අප කොමිෂන් සභාව පසුගිය 2018 වසරේ ස්වාධීනතාවය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ ඇගයීමට ලක්වෙමින් ශ්‍රේණිගත කිරීම් වල A ශ්‍රේණිය හිමිකර ගැනීම මානව හිමිකම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව ලද ජයග්‍රහණයකි. මෙම ජයග්‍රහණය අඛණ්ඩව පවත්වා ගනිමින් පුරවැසියන්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම අපගේ අරමුණ වේ. ඒ සඳහා කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කර ඒවාට සහන ලබාදීම සඳහා අපගේ නිර්දේශ රාජ්‍ය ආයතන වෙත යොමු කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නිර්දේශ එම ආයතන වෙත යවනු ලබන්නේ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය අනුව වේ. එනම්:

> "මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියකට හෝ තැනැත්තකුට හෝ තැනැත්තන්ට ඒ නිර්දේශයේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත ඒ නිර්දේශය බලාත්මක කිරීම පිණිස ඒ තැනැත්තා විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස නියම කරනු ලැබිය යුතු අතර, ඒ අනුව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම ඒ සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතුය"

15(8) වගන්තිය මෙසේය:

> "මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ නිර්දේශයේ සඳහන් කාලය ඇතුළත කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැරහැර ඇති අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ඔහු විසින් ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියාමාර්ගය කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක කොමිෂන් සභාව විසින් ඒ කරුණ පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ජනාධිපතිවරයා විසින් ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබීමට සැලැස්විය යුතුය"


| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04. | |
| සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011 2505541/74 | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | sechrcsl@gmail.com | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11- 2505580/81/82 | |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | |
| ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2505575 / 1996 | |
| වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | |

මේ අනුව කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම හෝ ඒ පිළිබඳව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හෙ එම ආයතනයේ වගකීම වේ.

එහෙත් සමහර රාජ්‍ය නිලධාරීන් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකරන අතර, ඒ පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ගය වාර්තා කිරීම පැහැරහරින අවස්ථා ඇත. මෙම තත්ත්වය ජනතාවට ඉතාම අහිතකර වේ. ජනතාව විසින් කොමිෂන් සභාව මගින් අපේක්ෂා කරන අපගේ කර්තව්‍යයන් ඉටු කිරීමට එය මහත් බාධාවක් වේ. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ කාලයක් පුරා සාකච්ඡා කල අතර අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් පැවතියද පැමිණිලිකාර පාර්ශවයන් හට ඒ සඳහා විශාල මූල්‍යමය පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එයද සාර්ථක විසඳුමක් නොවේ.

මෙම තත්ත්වය වැළැක්වීම සඳහා අප කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ගය වාර්තා කිරීම හෝ පැහැරහරින රජයේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන ප්‍රතිපාදන රජයේ ආයතන සංග්‍රහයට ඇතුළත් කිරීම වඩාත් ඵලදායි ක්‍රමවේදය බවට කොමිෂන් සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව නිර්දේශ කර සිටියි.

ඒ අනුව පහත දැක්වෙන කොටස ආයතන සංග්‍රහයට ඇතුළත් කිරීම සුදුසු බව අදහස් කෙරේ.

> "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් යම් අධිකාරයකට හෝ යම් නිල්ධාරියෙකුට යම් නිර්දේශයක් යවමින් ඒ නිර්දේශයේ සඳහන් කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත එම නිර්දේශය බලාත්මක කිරීම පිණිස ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස නියම කරනු ලැබූ අවස්ථාවකදී එම නිර්දේශය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තා කිරීමට හෝ එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අපහසු/නොහැකි වන සාධාරණ හේතු ඇතොත් ඒවා දැන්වීමට හෝ එසේ නියම කරනු ලැබූ කාලය ඇතුළත ක්‍රියා කළයුතුය. රජයේ යම් නිලධරයකු විසින් එසේ නියමිත කාලය තුළ වාර්තා කිරීම පැහැරහැර ඇති අවස්ථාවල හෝ කොමිෂන් සභාව වෙත වාර්තා කර කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ඔහු විසින් ගෙන ඇති/ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ගය කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී හෝ ඒ පිළිබඳව ජනාධිපතිතුමා වෙත වාර්තා කරනු ඇත. එසේම ආයතන සංග්‍රහයේ **II** කොටසේ **XLVII** පරිච්ඡේදයේ **8:1** හි සඳහන් වන නිසි බලධාරියෙකු වශයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද නියමය නොසළකාහැර ඇති විටෙක (**8:2** වගන්තියේ සඳහන් පරිදි) එසේ කරන ලද නිලධාරියා පළමු උපලේඛනය යටතට වැටෙන බරපතල විෂමාචාරයක් කරන ලද සේ සළකා නියමිත නිසි බලධරයන් විසින් ඔහුට විරුද්ධව වහාම විනයානුකූල පියවර ගත යුතු වන්නේය".

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය නිලධාරීන් විසින් පැහැර හැරීම අවම කර ගැනීම සඳහා ඉහත යෝජනාව වඩාත්ම සුදුසු පියවර වනු ඇති බවට කොමිෂන් සභාවේ අදහස බව කාරුණිකව සඳහන් කරමු.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර සුදුසු පියවර ගනු ඇතැයි අපේක්ෂා කරමු.

ස්තූතියි.

මෙයට - විශ්වාසී,

මහාචාර්ය දීපිකා උඩගම
සභාපතිනි
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka